# ඔබ වෙනුවෙන් තම
# ජීවිතය පුදකළ තැනැත්තා



# ඔබ වෙනුවෙන් තම ජීවිතය පූදකළ තැනැත්තා

දෙවියන්වහන්සේ මනුෂ්‍යයා තම ස්වරූපයට මැවූ සේක. ඔහු දෙවිඳුන් සමග සහභාගිකම් පවත්වමින් ඔහු තුළ සාමය ප්‍රීතිය සහ පූර්ණ ශාරීරික සුවය ඇතුව සිටියාය. නමුත් ඔහු පව් කළ විට, දෙවිඳුන් සමග තිබූ සම්බන්දතාවයද, තමන් තුළ වූ සාමය සහ ප්‍රීතියද අහිමි කරගෙන, ශෝකයට භාජනයවී, ශාරීරික රෝගිබවටද, හදවතේ, ආත්මයේ සහ සිරුරේ අවිවේකී භාවයටද පත්විය.



එවැනි මිනිසකු මුදවාගෙන ඔහුට අහිමි වූ පෙරතිබූ තත්වයට ඔහු යලි සර්වප්‍රකාරයෙන්ම පත්කරන පිණිස අපේ මැවුම්කාර දෙවිඳුන් ලේ මාංස සහිතව වසර 2000 පමණ පෙර මෙලොව උපන්සේක. පව්රහිතවය එතුමන් ඉපදුනේය. මෙම පාපිෂ්ට ලෝකයේ පාපරහිත දිවියක් ගතකරමින්, මිනිසා හට යහපත කරන පිණිස ගම් සහ නගරයන් වටා ගමන් කලසේක. එතුමා අන්ධයින්ට පෙනීම ලබාදී, බිහිරන්ට කන් ඇසීමට සහ ගොළුවන්ට කතා කිරිමට සලස්වා, ලාදුරු රෝගීන් සුවකර, අශුද්ධ ආත්මයන් අරක්ගෙන සිටි මිනිසුන් මුදා, දුප්පතුන්ට ශුභාරංචිය දෙසූ සේක.



ලේ හැලීමක් නැතුව පව් කමාවක් නැත. ප්‍රාණයට වන්දිය ලෙයින් ගෙවිය යුතු බව ව්‍යවස්ථාවේ සඳහන් වන බැවින්, අප ස්වාමි යේසුස් මනුසත උදෙසා තම ලේ වගුරා කුරුසිය මත තම දිවි පුද කරන්නට තමන්වම යටත් කරගත් සේක. රෝම සොල්දාදුවෝ එතුමන්ට අඟලෙන් අඟල වධදුන්නෝ ය; එතුම හිස මත කටු ඔටුන්නක් තැබුවෝය; සැරයටියකින් ගස, තලමින්, කසපහරද දුන්නෝය; ඉන් පසු ඇන තුනකින් එල්ලා කුරුසිපත් කළෝය.





පාපය නොදත්, පව් නොකළ, පාප රහිත ස්වාමිවූ යේසුස් තුවලකරනු ලැබුවේ අපේ අපරාධ නිසාය. තලනු ලැබුවේ අපේ අයුතුකම් නිසාය. අපට සාමාදනය ගෙන ආ දඬුවම උන්වහන්සේ මත විය. පාපයේ කුලිය මරණයයි. මනුසත ලැබිය යුතුවූ දඬුවම යේසුස් ස්වාමින් තමන් මත ලබාගෙන මේ අන්දමින් කුරිසිය මත දිවි පිදූ සේක.

"අප උදෙසා ඇති දෙවියන් වහන්සේගේ ප්‍රේමය ප්‍රත්‍යක්ෂ වන්නේ අප පව්කාරයන්

ව සිටියදීම, ක්‍රිස්තුන් වහන්සේ අප උදෙසා දිවි පිදූ බැවිනි.” (රෝම 5:8.) ස්වාමිවූ යේසුස් කුරුසිය මත උකුත්වුව පමණක් නොව, පෙර කී ලෙස උන්වහන්සේ මරණය සහ පාතාලය පරදවා තුන්වෙනි දින උත්ථාන වූ සේක. උත්ථානවූ තැනැන්වහන්සේ සියලු ස්වර්ග අභිභවා ගොස් අදටත් අප වෙනුවෙන් ජීවත්ව සිටිනසේක.



ප්‍රියාදර මිත්‍රවරුනි! යේසුස් වහන්සේගේ ඔබ උදෙසා විඳි දුක් ගාවිනා සහ වේදනා ගැන  ඔබ මෙනෙහි කරන කළ, ඔබගේ ගල් හදවත උණුවේ. කඳුලෙන් පිරී ඔබගේ පාප සහ අපරාධ ගැන ස්වාමින් වහන්සේගෙන් කමාව ඇයදූ විට, උන්වහසේ ඔබ පාප කමාකොට ඔබහට සාමය, ප්‍රීතිය සහ විවේකය දානය කරයි. ‘’... එවිට උන් වහන්සේගේ පුත්‍රයාණන් වන ජේසුස් වහන්සේගේ ලේ සියලු පව්වලින් අප පවිත්‍ර කරන්නේ ය. ..අපි පාපෝච්චාරණය කරමු නම්, විශ්වාසවන්ත වූ ද, ධර්මිෂ්ඨ වූ ද, දෙවියන් වහන්සේ සියලු පාපවලින් ද අදමිටුකම්වලින් ද අප පවිත්‍ර කරන සේක.’’ (1 යොහාන් 7-9).



යේසුස් ක්‍රිස්තුස් වහන්සේ කුරුසිපත් වූයේ අප පාප උදෙසා පමණක් නොව, අපේ රෝග උදෙසාත්ය. “උන් වහන්සේම අපේ දුබලකම් දරා ගත් සේක; අපේ රෝ



දුක් බර උසුලාගත් සේක.’’ (මතෙව් 8:17) ‘’උන්වහන්සේ ලැබුවාවූ කසපහරින් අප සුවය ලබා සිටි.” (යෙසාය 53;5) මිනිසාගේ පාපය නිසා ශාපය පැමිණියා. ශාපය නිසා ඔහු මත ලෙඩ රෝග ඇතිවුනා. ස්වාමිවූ යේසුස් කුරුසිය මත



අපේ රෝග දරාගත්තා. අපි උන්වහසේ ලැබූ කසපහරින් අප සුවය ලැබූ බව අදහන්නේ නම්, රෝග තත්වයෙන් මුළුමනින්ම මිදී අපට ජීවත්විය හැක.

ප්‍රිය මිතුර! ඔබ වෙනුවෙන් දිවිපිදූ ස්වාමිවූ යේසුස් මළවුන්ගෙන් උත්ථාන වී දැනටත් ඔබ වෙනුවෙන් ජීවත්වන බව ඔබ අදහන්නේ නම්, එතුමන්ගේ රුධිරය කරණකොටගෙන ඔබගේ පාපයන්ට සහ රෝගයන්ට මිදීම ලැබිය හැක. ස්වර්ගයට ඇතුල්වීම සඳහා ශුධවූ දිවියක් ගතකිරීමට යේසුස් වහන්සේ ආදරයෙන් ඔබ අමතයි.

ක්‍රිස්තුස් වහන්සේගේ කුරුස පත්වීමෙන් ලැබෙන විශිෂ්ට ආශිර්වාද අත්කරගැනීමට ඔබ ආශාවෙන් සිටින්නේ නම්, පහත සඳහන් යාඥාව කියන්න:




**“ආදරණීය යේසුනි,**
**කල්වාරි කුරුසගසේ මගේ පාප වෙනුවෙන් ඔබේ දිවි පිදූ බව මම අදහමි. කරුණාකර මගේ පාප කමාකල මැනව. ඔබේ ලෙයින් මා සෝදා විශුධ කළ මැනව. මගේ පුද්ගලික ගැලවුම්කරු සහ දෙවියන් වහන්සේ ලෙසට මම ඔබවහන්සේ පිළිගනිමි. මෙතැන් පටන් මම ඔබේ දරුවෙකු ලෙස ජීවත් වෙමි. ආමෙන්.”**

